22	B 407/06	වතුර මෝටර්	1
23	10209	සෝලා පහන් කණු	5
24	13540	උදලු	1
25	අංක රහිත	පස්	කියුබ් 10
26	අංක රහිත	බොරළු	කියුබ් 06
27	අංක රහිත	වැලි	කියුබ් 08
28	67217	අත් ට්‍රැක්ටර්	1

අනු අංකය	නඩු අංකය	භාණ්ඩ විස්තරය	අයිතම ගණන
29	PR 96/12	අත් ට්‍රැක්ටර්	1
30	70335	MT 4708 යතුරු පැදි	1
31	34147	HM 6722 යතුරු පැදි	1
32	PMB/31/25	අංක රහිත යතුරු පැදි	1
33	PR 836/21	48CC යතුරු පැදි	1
34	30516	48CC යතුරු පැදි	1
35	B 215/10	අංක රහිත යතුරු පැදි	1
36	B 299/21	අංක රහිත යතුරු පැදි	1
37	PR 1653/21	අංක රහිත යතුරු පැදි	1

02 - 400

දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - ගල්ගමුව

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගල්ගමුව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද පහත උපලේඛනයේ දැක්වෙන නඩු භාණ්ඩ **2026.02.28** දින **පෙ.ව. 9.30** ට අධිකරණ භූමිය තුළ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ පිළිබඳ අයිතිවාසිකම් කියන්නකු සිටිනම් වෙන්දේසිය පැවැත්වෙන දින **පෙරවරු 9.00** ට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුය.

02. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂාකර බැලිය හැකිය.

03. වෙන්දේසියේ දී මිල දී ගන්නා භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේ දී ම මුදල් ගෙවිය යුතු අතර, **පස්වරු 4.00** ට පෙර අදාළ භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් පමණක් සිදුකළ යුතු අතර චෙක්පත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ.

04. වෙන්දේසියේ දී භාණ්ඩ මිල දී ගනු ලබන අය තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

05. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවක දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

06. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම් වෙන්දේසියේ කටයුතු අවසන් කිරීමට පෙර ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

ඩී. එම්. රවීන්ද්‍ර රන්ජන් බංඩාර,
මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - ගල්ගමුව.

2026 පෙබරවාරි මස 10 දින,
ගල්ගමුව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

උපලේඛනය

අනු අංකය	නඩු අංකය	දේ.කු. අංකය	නඩු භාණ්ඩ සම්බන්ධ විස්තර	ප්‍රමාණය
1	5227	-	නියන් අතකොලු යතුකැට	1 1 1
2	B 692/17	1535/17	වයර් රෝල් ප්ලග් පොයින්ට් 2 ක් සහිත ස්විච් බෝඩ්	1 1
3	84554	186/09	සවල්	2
4	25546	31/20	සවල්	1
5	30798	253/21	සවල්	1
6	B 354/17	742/17	පොරෝ	1
7	25215 B 626/19	1669/19	උදලු	1
8	12049	84/16	ග්‍රිල් මැෂින් වයර් රෝල් ග්‍රිල් කටු	1 2 2
9	18169	175/17	විදුලි ලාම්පු	1
10	30289	150/21	විදුලි පන්දම්	1
11	30490	379/21	යකඩ පොලු	1
12	32938	1137/21	උදලු	1
13	40317	335/23	පිහි	1
14	46063	436/24	ස්පැනර්	1
15	57845	2640/25	12.5 kg ලිට්‍රෝ නිල් පාට ගෑස් සිලින්ඩරය රෙගියුලේටරය සහිත ගෑස් ලිප්	1 1
16	43868	1394/23	දොර ලෑලි	1
17	40302	294/23	පිහි නියන්	1 1
18	43641	447/23	පිහි	1
19	21992	201/19	කුඩා පිහි	1
20	18325 B 188/18	-	පිහි	1
21	43705	1099/23	කැති	1
22	8546	-	හිස් වැසුම්	1
23	91046	135/11	අඟල් 1 1/2 ජල කරාම	1
24	15181	-	සවල්	1

අනු අංකය	නඩු අංකය	දේ.කු. අංකය	නඩු භාණ්ඩ සම්බන්ධ විස්තර	ප්‍රමාණය
25	46675	657/24	පිත්තල පොලු	1
26	39302	දේ.කු. 07/23	පිහි	1
27	42486	450/23	විදුලි පන්දම්	1
28	1180 B 527/13	-	කැති	1
29	31296	-	කැති තල	1
30	18412 B 165/18B	-	පොරෝ පිහි	1
31	751/17	1267/17	පොරෝ	1
32	B 457/18	136/08	ආරක්ෂක හිස් වැසුම්	1
33	31271		විදුලි වැට කම්බි රෝල්	1
34	94557 B 68/12	187/12	තාව්වි වයර් රෝල්	2 1
35	18208 B 636/17	1898/17	විදලු පන්දම්	1
36	37495	310/22	ජංගම දුරකථන	1
37	50301	-	උදලු	1
38	37146	-	කැති	1
39	26290	-	සවල් යකඩ ඉනි	1 2
40	B 9097/16	139/16	කණ්නාඩි මේස ලී පුටු	1 2
41	AR 1473/25	1751/25	අඟල් 2 වතුර මෝටර්	1
42	56727	-	උදලු	1
43	30412	-	කැති	1
44	56796	-	උදලු	1
45	28750	-	කැති	1
46	30344	-	කැති	2
47	26199	-	පොරෝ	1
48	55647	-	පොරෝ	1
49	30345	-	කැති	5
50	30410	-	කැති	1
51	28749	-	කැති	1

අනු අංකය	නඩු අංකය	දේ.කු. අංකය	නඩු භාණ්ඩ සම්බන්ධ විස්තර	ප්‍රමාණය
52	26168	-	කැති	1
53	33388	58/21	උදලු	1
54	29147	49/22	කැති	1
55	26171	17/20	කැති	1
56	B 502/19	449/19	අලවංගු	1
57	95443	-	මල් බාල්දි	1
58	95264	198/12	ඇලුමිනියම් මුට්ටි	1
59	B 72/08	-	ලණුව සහිත ප්ලාස්ටික් බාල්දි	1
60	23637	-	පෙට්‍රොා මැක්ස්	1
61	46581	-	රයිස් කුකර් වලන්	1
62	B 524/14	-	ප්ලාස්ටික් බකට්	1
63	61458	-	බකට්	1
64	58505	-	වක් පිහි	1
65	54746	1187/25	පොල් ගෙඩි	3
66	නඩු අංක රහිත	-	කටු කම්බි රෝල්	2
67	නඩු අංක රහිත	-	ටයර්	8
68	නඩු අංක රහිත	-	කියත්	1
69	නඩු අංක රහිත	-	50kg යූරියා, මඩපොහොර, රතු කුඩු ඇතුලු පොහොර මිටි	2 1/2
70	නඩු අංක රහිත	-	ලොකු බේසම්	1
71	නඩු අංක රහිත	-	තාච්චි	2
72	නඩු අංක රහිත	-	තාච්චි	1
73	නඩු අංක රහිත	-	විදුලි පන්දම්	1
74	නඩු අංක රහිත	-	ඇලුමිනියම් සාස්පාන්	1
75	නඩු අංක රහිත	-	ඇලුමිනියම් මුට්ටි	1
76	නඩු අංක රහිත	-	අත් කියත්	1
77	නඩු අංක රහිත	-	උදලු	2
78	නඩු අංක රහිත	-	පිකස්	1
79	නඩු අංක රහිත	-	පොරෝ	1
80	නඩු අංක රහිත	-	කැති	4
81	නඩු අංක රහිත	-	වාහන බෙල්ට් තොගය	
82	නඩු අංක රහිත	-	ලැන්ඩ් මාස්ටර් වල හැඩල් තොගය	
83	නඩු අංක සහිත	-	වීදුරු බෝතල්	600

අනු අංකය	නඩු අංකය	දේ.කු. අංකය	නඩු භාණ්ඩ සම්බන්ධ විස්තර	ප්‍රමාණය
84	නඩු අංක සහිත	-	කුඩා කෑන්	10
85	නඩු අංක සහිත	-	ප්ලාස්ටික් ලොකු බූලි	42
86	නඩු අංක සහිත	-	ලොකු යකඩ බැරල්	18
87	නඩු අංක සහිත	-	කුඩා යකඩ බැරල්	8
88	නඩු අංක රහිත	-	පා පැදිය	1
89	නඩු අංක රහිත	-	පොල් ගෙඩි	100
90	56407	1582/25	පොල් ගෙඩි	30
91	56539	1584/25	පොල් ගෙඩි	21
92	38300	788/22	අංක CP GV දරන යතුරු පැදිය	
93	96354	191/12	අංක 121 6025 දරන යතුරු පැදිය	

02 - 415

මහෙස්ත්‍රාත් අධිකරණය - බදුල්ල

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

රාජසන්තක කරන ලද පහත සඳහන් නඩු භාණ්ඩ **2026.03.07 සෙනසුරාදා දින පෙ.ව. 10.30** ට බදුල්ල මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් පිළිබඳ හිමිකම් පාන්නන් සිටියි නම්, වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට **පැය 1/2 කට** පෙර වෙන්දේසියේ විකිණීමට ඇති භාණ්ඩ පරීක්ෂාකර බැලිය හැකි ය. අධිකරණය විසින් නියම කරනු ලබන ලංසුව නොපිළිගැනෙන අවස්ථාවක දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතු ය.

03. වෙන්දේසි කිරීමට නියමිත වාහන ය සම්බන්ධයෙන් මාස 03 ක් ඇතුළත ලියාපදිංචි කිරීමේ ලේඛන ඉදිරිපත් කළ යුතු ය.

04. වෙන්දේසියට සහභාගී වන අය තම අනන්‍යතාවය සනාථ කිරීමට ජාතික හැඳුනුම්පත රැගෙන ඒම අනිවාර්ය වේ.

05. භාණ්ඩ මිල දී ගැනීම ලංකාවේ වලංගු මුදලින් කළ යුතු අතර, ඒ සඳහා අධිකරණය මගින් රිසිට්පතක් නිකුත් කරනු ලැබේ.

06. මිල දී ගන්නා භාණ්ඩ වෙන්දේසි දින **ප.ව. 4.00** ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

උදිත එස්. ගුණතිලක,
මහෙස්ත්‍රාත් සහ අතිරේක දිසා විනිසුරු,
මහෙස්ත්‍රාත් අධිකරණය - බදුල්ල.

2026 පෙබරවාරි මස 17 දින,
බදුල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

උපලේඛනය

අනු අංක	නඩු අංකය	භාණ්ඩ විස්තරය
1	82496	යකඩ බැරල් 01
2	82139	ප්ලාස්ටික් බැරල් 01
3	82491	ප්ලාස්ටික් කුඩා බැරල් 01
4	82350	ප්ලාස්ටික් බූලි 03
		ඇලුමිනියම් මුට්ටි 01
		ඇලුමිනියම් තාච්චි 01
5	82495	ප්ලාස්ටික් බූලි 01
6	82397	ප්ලාස්ටික් බූලි 01
7	82501	ප්ලාස්ටික් බූලි 01
8	82486	කෑන් 01
9	82484	ප්ලාස්ටික් බෝතල් 01
10	82500	ප්ලාස්ටික් බෝතල් 01
11	82362	ප්ලාස්ටික් බෝතල් 01
12	82502	ප්ලාස්ටික් කෑන් 01
13	82481	ප්ලාස්ටික් කෑන් 01
14	82359	ප්ලාස්ටික් කෑන් 01
15	82387	කෑන් 01
16	82357	ප්ලාස්ටික් බෝතල් 01
17	82361	ප්ලාස්ටික් බූලි 01
18	82398	ප්ලාස්ටික් කෑන් 01
19	82415	ප්ලාස්ටික් බූලි 01
20	82488	නිල් පාට කුඩා බූලි 01
21	82492	ප්ලාස්ටික් කෑන් 01
22	82404	කට කපන ලද ප්ලාස්ටික් කෑන් කොටස් 01
23	82367	සවල් 01
24	82388	ප්ලාස්ටික් බූලි 02
25	82798	කෑන් 01
		බූලි 01
26	82795	ප්ලාස්ටික් බෝතල් 01
27	82794	ප්ලාස්ටික් බෝතල් 01
28	82797	ප්ලාස්ටික් කෑන් 01

අනු අංක	නඩු අංකය	භාණ්ඩ විස්තරය
29	82746	බූලි 01
30	82745	බූලි 02
31	82750	කෑන් 01
32	82697	කෑන් 01
33	82623	ප්ලාස්ටික් බෝතල් 01
34	82622	යකඩ බැරල් 01
		බූලි 01
35	82621	බූලි 01
36	82620	බූලි 01
37	82618	බූලි 01
38	82617	බූලි 02
39	82615	බූලි 01
40	82561	ප්ලාස්ටික් බෝතල් 01
41	82564	කපන ලද බූලි 01
42	82565	ප්ලාස්ටික් බකට් 01
43	82479	ප්ලාස්ටික් කෑන් 01
44	82379	බූලි 01
45	82348	කෑන් 01
		ප්ලාස්ටික් බකට් 03
		ඇලුමිනියම් තාව්වි 01
		ඇලුමිනියම් මුට්ටි 01
46	82346	ඇලුමිනියම් මුට්ටි 01
		ප්ලාස්ටික් කෑන් 01
		ඇලුමිනියම් තාව්වි 01
47	81416	ප්ලාස්ටික් බෝතල් 01
48	80421	ප්ලාස්ටික් බූලි 01
49	80106	ප්ලාස්ටික් බූලි 01
50	81786	ප්ලාස්ටික් බකට් 02
		ඇලුමිනියම් මුට්ට 01
		ඇලුමිනියම් සාස්පාන් 01
		ප්ලාස්ටික් ජෝග්ගු 02
51	82613	බූලි 01

අනු අංක	නඩු අංකය	භාණ්ඩ විස්තරය
52	82800	යකඩ බාල්දි 01
53	82805	යකඩ බාල්දි 01
54	82799	සවල් 01
55	82378	සවල් 01
		යකඩ බාල්දි 01
56	82394	ප්ලාස්ටික් බාල්දි 01
		උදලු 01
57	82515	සවල් 01
58	82631	සවල් 01
59	82405	කෑන් 01
60	82901	කෑන් 01
61	82905	බකට් 01
62	82906	කෑන් 01
63	82911	ප්ලාස්ටික් බෝතල් 01
64	82914	කෑන් 01
65	82990	ප්ලාස්ටික් බෝතල් 01
66	82992	ප්ලාස්ටික් බූලි 01
67	83040	කෑන් 01
68	83041	ප්ලාස්ටික් බූලි 03
69	83044	ප්ලාස්ටික් බෝතල් 01
70	83045	ප්ලාස්ටික් බෝතල් 01
71	83047	ප්ලාස්ටික් බෝතල් 01
72	81462	කුඩා යකඩ බැරල් 01
		ප්ලාස්ටික් බූලි 01
73	81461	ප්ලාස්ටික් බකට් 01
74	81290	ප්ලාස්ටික් බෝතල් 01
75	අංක රහිත	ප්ලාස්ටික් බෝතල් 01
76	81457	බකට් 01
77	80675	බූලි 01
78	83221	බූලි 01
79	83225	බූලි 01
80	83217	ප්ලාස්ටික් බෝතල් 01

අනු අංක	නඩු අංකය	භාණ්ඩ විස්තරය
81	83213	කෑන් 01
82	83200	කෑන් 01
83	82701	ප්ලාස්ටික් බෝතල් 01
84	83138	බූලි 01
85	83123	ප්ලාස්ටික් බෝතල් 01
86	83122	කෑන් 01
87	83126	කෑන් 01
88	83059	බූලි 01
89	83058	බූලි 02
		මුට්ටි 02
		සාස්පාන් 01
		සිල්වර් පිඟන් 01
90	83062	ප්ලාස්ටික් බෝතල් 01
91	83064	ඇලුමිනියම් මුට්ටි 01
		ඇලුමිනියම් කළ 01
92	83070	කෑන් 01
93	82904	කෑන් 01
94	82854	කෑන් 01
95	82857	බකට් 01
96	82831	බූලි 01
97	82841	ප්ලාස්ටික් කළගෙඩි 01
98	82748	බූලි 01
		ප්ලාස්ටික් බකට් 01
99	82749	කුඩා බැරල් 01
		ප්ලාස්ටික් බකට් 02
100	82562	කෑන් 01
101	81987	බූලි 01
102	82713	කෑන් 01
103	73806	ප්ලාස්ටික් මේස 01
		ප්ලාස්ටික් පුටු 06
		මෙට්ට 01
		ගෑස් සිලින්ඩර් 01

අනු අංක	නඩු අංකය	භාණ්ඩ විස්තරය
		ප්ලාස්ටික් රාක්ක 01
104	55169	ෂීට් 02 ක්
105	50770	බැටරි 01
106	83171	උදලු 01
107	83173	පිහි 01
108	83174	උදලු 01
109	83175	පිහි 01
110	83176	පිහි 01
111	83178	උදලු 01
112	83177	උදලු 01
113	83170	උදලු 01
114	58266	බැටරි 01
115	58265	බැටරි 01
116	34040	හෙල්මට් 01
117	13698	බැටරි 01
118	20545	ත්‍රීරෝද රථ ටයර් 01
119	36103	කාන්තා බ්ලවුස් 08
120	61588	යකඩ කැබලි 04
121	56608	ප්ලාස්ටික් පුටු 01
122	48148	UPBGS 7603 යතුරුපැදි 01 (ලියාපදිංචි කල හැක.)
123	82008	කපන ලද කෑන් 01
124	82015	කෑන් 01
125	82134	කෑන් 01
126	PR.06/05	පිහි 02
127	96355	යතුර සමඟ ඉබ්බි 02
		කුඩා දම්වැල් 01
128	අංක රහිත	ප්ලාස්ටික් කේස් 08
129	73728	ඇලුමිනියම් මුට්ටි 01
130	අංක රහිත	ඇලුමිනියම් මුට්ටි 01
131	79115	ඇලුමිනියම් මුට්ටි 01
132	අංක රහිත	ඇලුමිනියම් තාච්චි
133	56547	ඇලුමිනියම් මුට්ටි 01

අනු අංක	නඩු අංකය	භාණ්ඩ විස්තරය
134	අංක රහිත	කුඩා ප්ලාස්ටික් බේසම් 01
135	80470	අලුමිනියම් කල 01
136	56032	ඇලුමිනියම් සාස්පාන් 01
137	74918	ඇලුමිනියම් සාස්පාන් 01
138	22273	VCD යන්ත්‍ර 01
139	අංක රහිත	තරාදි 02
140	PR 144	දුණු තරාදි 01
141	4217	තරාදි 01
142	21835	තරාදියක්
		තරාදි තැටියක්
		පඩි 06 ක්
143	28675	තරාදි 01
144	අංක රහිත	දුණු තරාදි 01
145	7076	තරාදි 01
146	අංක රහිත	තරාදි 01
147	අංක රහිත	දුණු තරාදි 02
		තට්ටු තරාදි 01
		කොකු 02, තරාදි පඩි 01
148	අංක රහිත	තරාදියක කොටසක් හා තරාදි පඩි 15 ක්
149	අංක රහිත	තැටි 01
150	අංක රහිත	තැටි 01
151	අංක රහිත	කම්බි 01
152	අංක රහිත	විවිධ ප්‍රමාණවලින් යුතු කම්බි 06
153	22641	ඉටි රෙදි කැබලි 01
154	22654	තරාදි 01
155	20583	තරාදි පඩි 02
156	අංක රහිත	අංක රහිත තරාදියක් හා පඩි 05 ක්
157	41869	තරාදියක පඩි 07 ක්
158	22909	තරාදියක් හා පඩි 07 ක්
159	අංක රහිත	තරාදියක් හා පඩි 03 ක්
160	අංක රහිත	තරාදි පඩි 06
161	අංක රහිත	තරාදියක් හා පඩි 02 ක්

අනු අංක	නඩු අංකය	භාණ්ඩ විස්තරය
162	අංක රහිත	තරාදි කොටස් දෙකක්
163	අංක රහිත	දුණු තරාදි 02 ක්
164	43155	තරාදි පඩි පාර්සල් 01
165	42218	තරාදි පඩි පාර්සල් 01
166	43156	තරාදි පඩි පාර්සල් 01
167	අංක රහිත	තරාදි පඩි කිහිපයක්
168	අංක රහිත	තරාදි පඩි 02 ක්
169	අංක රහිත	තරාදි පඩි 08 ක්
170	75517	ගෑස් ලිප් 01
171	70358	චීනච්චට්ටි බට කොටසක්
172	BR 931/04	ඇලුමිනියම් රේඩියේටර් කොටසක්
173	PR 143/2002	තරාදි කොටසක් හා දුම් කබලක්
174	අංක රහිත	යකඩ තැටි 01
175	අංක රහිත	තරාදි 01
176	65775, PR 03/13 (65884)	ලාම්පු 02
177	22653	කරඩි 02
178	22645	ටේප් 01
179	අංක රහිත	ඇණ කැබලි හා විවිධ හැඩයේ යකඩ කැබලි
180	PR558/05	කැඩීගිය ලිපක කොටසක්
181	16834	ලණු 03 ක්, පිහි 01 ක්, අඩුවක්, යකඩ කූරු, යතුරු 01
182	PR 857/23	බූලියක්
183	71454	ප්ලාස්ටික් කෑන් කොටසක්
184	PR 228/23, 64991	ප්ලාස්ටික් බකට් 02 ක්
185	අංක රහිත	ප්ලාස්ටික් බකට් 01 ක්
186	75756	යකඩ බාල්දියක්
187	අංක රහිත	PVC බට කැබැල්ලක්
188	අංක රහිත	පනිට්ටු 01
189	අංක රහිත	මාලු දැලක්
190	අංක රහිත	ප්ලාස්ටික් බූලි 01 ක්
191	අංක රහිත	යකඩ තාච්චියක්
192	අංක රහිත	විවිධ උපකරණ කිහිපයක්
193	අංක රහිත	යකඩ කොටසක්, යකඩ පටියක්

අනු අංක	නඩු අංකය	භාණ්ඩ විස්තරය
194	අංක රහිත	කෝප්ප හා විවිධ කුඩා උපකරණ කිහිපයක්
195	අංක රහිත	ෆෑන් එකක්
196	අංක රහිත	උදලු තල 01, රෙගියුලේටර් කොටස් 01
197	අංක රහිත	ස්පීකර් කොටස් 02 ක්
198	අංක රහිත	ෆෝන් එකක්, කැමරා එකක්, කැමරා කවර එකක්
199	24191	ප්ලාස්ටික් බකට් 01
200	89907	කෑන් 01
201	48857	බූලි 01
202	අංක රහිත	බකට් 01 ක්
203	PR 1433/21	බකට් 01
204	70327	කෑන් 01
205	22909	කෑන් 01
206	BR 88544	කෑන් 01
207	96586	කෑන් 01, යකඩ කොටස් 01
208	PR.1234/21	සිල්වර් පිඟන් 01
209	අංක රහිත	යකඩ තාච්චි 01
210	74992	යකඩ පනිට්ටු 01
211	අංක රහිත	ඇලුමිනියම් පෝච්චි 01
212	අංක රහිත	වයර් කොටස් 03
213	PR.186/13	ප්ලාස්ටික් බේසම් 01
214	51810	කෑන් 01
215	PR.1239/21	ප්ලාස්ටික් තැටි 01
216	අංක රහිත	මූඩි 01
217	අංක රහිත	යකඩ කැබලි තොගය
218	1899	ස්ක්‍රේපර් 01
219	අංක රහිත	මේසන් හැන්දක්, නියනක්, යකඩ කැබලි 02
220	අංක රහිත	සිල්වර් තැටි 02
221	අංක රහිත	ෆෑන් කොටසක්
222	අංක රහිත	ප්ලාස්ටික් බකට් 03
223	අංක රහිත	යකඩ බාල්දි 01
224	අංක රහිත	අබලි යකඩ කැබලි කිහිපයක්
225	අංක රහිත	ෆෝන් 03

අනු අංක	නඩු අංකය	භාණ්ඩ විස්තරය
226	අංක රහිත	දුරස්ථ පාලක 01
227	91069	ඇලුමිනියම් මුට්ටි 02
228	අංක රහිත	වඩු උපකරණ කිහිපයක්
229	99885	ලණු කිහිපයක්
230	අංක රහිත	ෆිස්ටන් කැබලි 04 හා යතුරු පැදියක අමතර කොටස් කිහිපයක්
231	අංක රහිත	පලංචි ක්ලැම්ප්
232	BR/882/04	අබලි යකඩ කැබලි කිහිපයක්
233	අංක රහිත	සෙරෙප්පු ජෝඩු කිහිපයක්
234	අංක රහිත	යකඩ ඇණ තොගයක්
235	අංක රහිත	භාවිතයෙන් ඉවත් කරන ලද මෝටර් ආමේචස් 01,විදුලි හීටර් කොටස් කිහිපයක්
236	59971	ප්ලාස්ටික් බාල්දි 01
237	අංක රහිත	වාජර් 01, වයර් 01
238	අංක රහිත	විදුලි පන්දම් 01
239	අංක රහිත	ඇණ ගැසූ ලී කැබලි 01
		පලන ලද ලී කැබලි 01
		ඇද වූ ලී කැබලි 01
		යකඩ සුරයක් සහිත කිතුල් ලී 01
240	අංක රහිත	පොත්ත සහිත දර ලී කැබලි 01
		පැත්තක් උල්කළ නංවි ලී 01
		ගැට සහිත තීන්ත ආලේප කළ ලී 01 ක්
241	අංක රහිත	කිතුල් පොලු 01
242	අංක රහිත	ලී මිටක කොටසක්
		ලී මිටක කොටසක්
		යකඩ මාර ලීයක කොටසක්
243	අංක රහිත	නංවි කෝටු කැබලි 04 ක්
244	අංක රහිත	ඉරණ ලද ලී පටි කැබලි 05 ක්
245	අංක රහිත	කළු පාට ඉරන ලද ලී කැබලි 07 ක්
246	අංක රහිත	පොතු ඉවත් කල ලී 01 ක්
247	අංක රහිත	පොතු ඉවත් කල ලී 01 ක්
		පොතු ඉවත් කල ලී 01 ක්
248	17742	කොසු මිට 01 ක්

අනු අංක	නඩු අංකය	භාණ්ඩ විස්තරය
249	අංක රහිත	නංවි කෝටු 06 ක්
250	අංක රහිත	කුඩා ලී කැබලි 03 ක්, තරමක් දිග ලී කැබලි 03 ක්
251	අංක රහිත	නංවි ලී කැබලි 04 ක්
252	අංක රහිත	විවිධ ප්‍රමාණයේ ලී කැබලි 04 ක්
253	අංක රහිත	පොතු ඉවත් කරන ලද ලී කැබලි 01 ක්
254	අංක රහිත	බැට් එකක කොටසක්, මීටර් කෝදු 02 ක්, ඉරණ ලද ලී
		කැබලි 01 ක්
255	අංක රහිත	මද්දක කොටසක්
256	අංක රහිත	කෝටු කැබලි 04 ක්
257	අංක රහිත	දිරා ගිය පරාල කැබලි 01 ක්
258	අංක රහිත	සුදු පාට තීන්ත තැවරූ දිරාගිය පරාල කොටසක්
259	අංක රහිත	දිරා ගිය පරාල කැබලි 01 ක්
260	අංක රහිත	දිරා ගිය පරාල කැබලි 03 ක්
261	අංක රහිත	දිරා ගිය පරාල කැබලි 02 ක්
262	අංක රහිත	යකඩ ඇණයක් සහිත දිරා ගිය පරාල කොටසක්
263	අංක රහිත	දිරාගිය පරාල කැබලි 01
264	අංක රහිත	ඉරණ ලද ලී පළු කැබලි 2 ක්
265	අංක රහිත	රීප්ප පටි කැබලි 08 ක්
266	අංක රහිත	කළු තෙල් ගා ඇති පරාල 01 ක්
267	අංක රහිත	එක් කෙළවරක් උල් කර තිබූ කට්ට දෙකක් කපා ඇති
		රීප්ප 01 ක්
268	අංක රහිත	පරාල කැබලි 02 ක්
269	PR 218/24	පරාල කැබලි 01 ක්
270	31997	දිරා ගිය පරාල කැබලි 01 ක්
271	අංක රහිත	විවිධ දිග ප්‍රමාණවලින් යුතු බට කැබලි 25 ක්
272	අංක රහිත	විවිධ දිග ප්‍රමාණවලින් යුතු බට කැබලි 07 ක්
273	අංක රහිත	විවිධ දිග ප්‍රමාණවලින් යුතු බට කැබලි 05 ක්
274	6190	දිග අඩි 04 යි අඟල් 09 ක් හා පළල අඟල් 09 ක් වූ බට කැබලි 01 ක්
275	PR 79/22	වැල් 01 ක් සහිත බට කැබලි 01
276	PR 439/22	බට කැබලි 01 ක්
277	අංක රහිත	කට කපන ලද බූලි 07 ක්
		කට කපන ලද කෑන් 02 ක්

අනු අංක	නඩු අංකය	භාණ්ඩ විස්තරය
278	අංක රහිත	කට කපන ලද බූලි 04 ක්
279	අංක රහිත	කට කපන ලද කෑන් 07 ක්
280	අංක රහිත	අවන් එකක්
281	අංක රහිත	කැසට් එකක කොටසක්
282	අංක රහිත	ඩී.වී.ඩී.ප්ලේයර් එකක්
	අංක රහිත	කැසට් ප්ලේයර් එකක්
283	අංක රහිත	ග්‍රයින්ඩර් කොටසක්
284	අංක රහිත	වාහන කැසට් එකක කොටස් එකක්
285	අංක රහිත	කැසට් එකක කොටස් එකක්
286	අංක රහිත	විදුලි තරාදියක කොටසක්
287	අංක රහිත	වාහන කැසට් එකක්
288	අංක රහිත	ස්පීකර් රහිත බඟල් එකක්
289	අංක රහිත	කුඩා කැසට් යන්ත්‍රයක්
290	අංක රහිත	ටෝස්ටර් එකක්
291	අංක රහිත	හෝම් තියටර් බඟල් එකක්
292	අංක රහිත	ඇම්ප් එකක්
293	අංක රහිත	කුඩා බඟල් එකක්
294	අංක රහිත	කුඩා බඟල් හතරක්
295	අංක රහිත	කැසට් එකක ප්ලාස්ටික් කොටසක්
296	අංක රහිත	කුඩා කැසට් එකක්
297	අංක රහිත	ප්‍රින්ටර් එකක්
298	අංක රහිත	විවිධ උපකරණවල තැටි 04 ක්
299	අංක රහිත	කැමරා එකක්, කැමරා කොටසක්
	අංක රහිත	විදුලි පරිපථ කොටසක්
300	අංක රහිත	රූපවාහිනී යන්ත්‍ර එකක්
301	අංක රහිත	රූපවාහිනී යන්ත්‍ර එකක්
302	බීආර් 852/05	ප්ලාස්ටික් කොටස් එකක්
303	බීආර් 222/06	ඩී.වී.ඩී.ප්ලේයර් එකක්
304	බීආර් 59/2002	ඩී.වී.ඩී.ප්ලේයර් එකක්
305	පීආර් 58	රයිස් කුකර් කොටස් එකක්
306	ඒආර්.402/12	ඩී.වී.ඩී.ප්ලේයර් එකක්
307	ඒආර්.48/2000	ඩී.වී.ඩී.ප්ලේයර් එකක්

අනු අංක	නඩු අංකය	භාණ්ඩ විස්තරය
308	බීආර් 1133/04	ඩී.වී.ඩී.ප්ලේයර් එකක්
309	බීආර් 199/03	කැසට් යන්ත්‍ර එකක්
310	පීආර් 69/02	කැසට් යන්ත්‍ර එකක්
311	බීආර් 891/03	කුඩා කැසට් යන්ත්‍ර එකක්
312	බීආර් 852/05	පරිගණක යතුරු පුවරු එකක්
313	පීආර් 37/94	ස්ටැබිලයිසර් එකක්
314	අංක රහිත	රූපවාහිනී යන්ත්‍ර එකක්
315	පීආර් 134/96	කැසට් යන්ත්‍ර එකක්
316	15100	කැසට් යන්ත්‍ර එකක්
317	34508	ඩී.වී.ඩී.ප්ලේයර් එකක්
318	4965	ඩී.වී.ඩී.ප්ලේයර් එකක්
319	1899	ඩී.වී.ඩී.ප්ලේයර් එකක්
320	85890	කැසට් යන්ත්‍ර එකක්
321	96135	සී.ඩී.ප්ලේයර් එකක්
322	72126	ඩී.වී.ඩී.ප්ලේයර් එකක් හා රිමෝට් එකක්
323	67748	ඇම්ප් එකක්
324	3338	බඟල් එකක් හා ඇම්ප් එකක්
325	78959	ඩී.වී.ඩී.ප්ලේයර් එකක්
326	85922	කැසට් යන්ත්‍ර එකක්
327	93203	විදුලි තරාදියක කොටස් එකක්
328	78959	ඩී.වී.ඩී.ප්ලේයර් එකක්
329	84414	විදුලි තරාදි එකක්
330	3568	ඩී.වී.ඩී.ප්ලේයර් එකක්
331	93676	ඩී.වී.ඩී.ප්ලේයර් එකක්
332	77590	ඇම්ප් එකක්
333	බීආර් 1321/04	රූපවාහිනී යන්ත්‍ර එකක්
334	අංක රහිත	වයර් සහිත රිමෝට් දෙකක්
335	41829	තරාදි එකක්, තරාදි පඩි එකක්, විදුලි පන්දම් එකක්
336	අංක රහිත	කෝප්ප 12
337	අංක රහිත	තරාදි එකක්
338	අංක රහිත	ඇන්ටනා කුරු කැබලි කිහිපයක් හා බූස්ටර් එකක්
339	අංක රහිත	යකඩ දම්වැල්
340	3119	රිම් එකක් සහිත ටයරය

අනු අංක	නඩු අංකය	භාණ්ඩ විස්තරය
341	පීආර් 112/05	පිත්තල පහනක කොටස් දෙකක් හා යකඩ කූරක්
342	බීආර් 988/03	ලණුවක් අඩංගු පොහොර බෑගයක්
343	47175	බෙහෙත් ඉසින ටැංකි 01
344	පීආර්.1747/22	උදලු 01
345	63299	උදලු 01
346	72428	උදලු 01
347	59853	උදලු 01
348	78929	උදලු 01
349	30963	උදලු 01
350	පීආර් 136/21	උදලු 01
351	පීආර් 613/23	උදලු 01
352	36726	උදලු 01
353	38472	උදලු 01
354	38472	උදලු 01
355	53640	උදලු 01
356	80926	උදලු 01
357	16621	උදලු 01
358	18340	උදලු 01
359	93580	උදලු 01
360	63821	උදලු 01
361	3265	උදලු 01
362	61635	උදලු 01
363	29420	උදලු 01
364	70286	උදලු 01
365	අංක රහිත	උදලු 01
366	62627	උදලු 01
367	40220	උදලු 01හා යකඩ බට කැබලි 01
368	අංක රහිත	උදලු 01
369	63821	උදලු 01
370	49848	උදලු 01
371	පීආර් 535/19	උදලු තලය
372	පීආර් 284/24	උදලු තලය

අනු අංක	නඩු අංකය	භාණ්ඩ විස්තරය
373	37763	රේක්කය
374	63921	උදලු 01
375	අංක රහිත	පිකස් 01
376	අංක රහිත	කුලුගෙඩි 01
377	62506	සවල් 01
378	ඒආර් 602	සවල් 01
379	ඒආර් 146/22	සවල් 01
380	පීආර් 211/21	සවල් 01
381	48250	සවල් 01
382	71244	සවල් 01
383	පීආර් 976/22	සවල් 01
384	54277	සවල් 01
385	62723	සවල් 02
386	23651	සවල් 01
387	පීආර් 1443/22	සවල් 01
388	78624	සවල් 01
389	පීආර් 734/23	සවල් 01
390	83281	කෑන් 01
391	83280	කෑන් 01
392	82224	ප්ලාස්ටික් බෝතල් 01
393	83434	ප්ලාස්ටික් බකට් 01
394	83431	ප්ලාස්ටික් බකට් 01
395	83429	ප්ලාස්ටික් කෑන් 01
396	83415	ප්ලාස්ටික් බකට් 01
397	83414	කෑන් 01
398	83411	බූලි 01
399	83410	යකඩ බැරල් 01
		ප්ලාස්ටික් බැරල් 01
		ප්ලාස්ටික් බැරල් භාග 01
400	83408	බූලි 01
401	83407	ප්ලාස්ටික් බෝතල් 01
402	83406	ප්ලාස්ටික් කෑන් 01

අනු අංක	නඩු අංකය	භාණ්ඩ විස්තරය
403	83405	බුලි03
		කෑන් 03
		ඇලුමිනියම් මුට්ටි 02
		ඇලුමිනියම් තාච්චි 01
404	83404	බුලි 01
405	83403	ඇලුමිනියම් කළ 01
		ප්ලාස්ටික් බැරල් 01
		ගෑස් සිලින්ඩර් 01
		ගෑස් ලිප් 01
406	83402	කෑන් 02
407	83400	බුලි 01
408	83397	බුලි 01
409	83396	ඇලුමිනියම් කළ 01, බුලි 01
		ප්ලාස්ටික් බෝතල් 01
410	83288	කෑන් 01
411	83286	ප්ලාස්ටික් බකට් 01
412	83283	ප්ලාස්ටික් බෝතල් 01
413	86425	තහඩු බැරල් 03
414	අංක රහිත	ලී ස්ටූල් 01
415	රාජසන්තක කළ	හිස් බෝතල් තොගයක්
416	අංක රහිත	අලවංගු 07
417	අංක රහිත	කම්බි 03
418	අංක රහිත	දුණුකොළ කැබලි 14
419	පීආර් 91/08	බුරුම 01
420	65775	ඇලුමිනියම් නැඹිලි 01
421	අංක රහිත	සාස්පාන් 01
422	අංක රහිත	තරාදි කොටස් 05
423	38430	ගෑස් ලිප් 01
424	අංක රහිත	හිස් ප්ලාස්ටික් බෝතල් කේස් 05
425	අංක රහිත	අබලි තරාදි යකඩ කොටසක්, සිල්වර් තැටි 03
426	77669	බුලි 01
427	පීආර් 96/16	යකඩ තාච්චි 01
428	අංක රහිත	ගැරුම් වට්ටි 01, කැට කූඩ 01

අනු අංක	නඩු අංකය	භාණ්ඩ විස්තරය
429	78052	ප්ලාස්ටික් බකට් 01
430	පීආර් 1790/24	ප්ලාස්ටික් බකට් 01
431	අංක රහිත	ප්ලාස්ටික් බකට් 01
432	පීආර් 2676/25	ප්ලාස්ටික් බකට් 01
433	94787	ප්ලාස්ටික් බකට් 01
434	පීආර් 70/24	ප්ලාස්ටික් බකට් 01
435	අංක රහිත	ප්ලාස්ටික් බකට් 01
436	පීආර් 675/22	ප්ලාස්ටික් බකට් 01
437	පීආර් 749/23	බකට් මූඩි 01
438	පීආර් 1638	කුඩා යකඩ බැරල් 01
439	65775	ප්ලාස්ටික් කෑන් 01
440	අංක රහිත	කොහු ලණු 01
441	77062	බෙහෙත් ඉසින සිල්වර් ටැංකි 01
442	77062	බෙහෙත් ඉසින ප්ලාස්ටික් ටැංකි 01
443	23856	බයිසිකල් රිම් 01 ක් සහිත ටයර් 01
444	පීආර් 450/19	කුඩා ප්ලාස්ටික් බකට් 01
445	11950	වතුර මෝටර් 01
446	18090	වාහන අමතර කොටස් 01
447	86840	ගෑස් ලිප් 01
448	පීආර් 745/17	දුණු තරාදි 01
		යකඩ කොකු 03
		ලොකු පිහි 01,
		මේස පිහි 04
449	43234	රිම් 01
450	පීආර් 127/08	දුණු කොළ කැබලි 05
451	අංක රහිත	යතුරු පැදි අමතර කොටස් 05
452	අංක රහිත	බැටරි 01
453	අංක රහිත	ප්ලාස්ටික් බට රෝලක කොටසක්
454	අංක රහිත	ලාම්පු 01
455	72536	ගෑස් ලිප් 01
		ප්ලාස්ටික් බට කොටසක්
456	75255	රෙගියුලේටරය සහිත ගෑස් ලිප් 01
457	66939	රෙගියුලේටරය සහිත ගෑස් ලිප් 01

අනු අංක	නඩු අංකය	භාණ්ඩ විස්තරය
458	56222	ගෑස් ලිප් 01
459	84726	ගෑස් ලිප් 01
460	66935	ගෑස් ලිප් රදවන 01
461	අංක රහිත	කේබල් 1
462	11576	රබර් කේබල් 01
463	4576	රබර් කේබල් 01
464	අංක රහිත	කේබල් 02

02 - 399

රජයේ නොවන දැන්වීම්

කෝපරේට් ඩී. සොලූටියෝ (පීවීටී) එල්ටීඩී

2007 අංක 07 දරන සමාගම් පනතේ 59 වගන්තිය යටතේ ප්‍රකාරව මෙයින් පොදු මහජනතාව වෙත දැනුම් දෙනු ලබන වග නම්, සිය ලියාපදිංචි කාර්යාලය අංක 45, මෝර් පාර, කොළඹ - 06 හි පිහිටි සමාගම් ලියාපදිංචි අංක PV 00212108 දරන ඇඩ්ස් ක්ලෝත් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින් එහි ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් තිස්පන් මිලියන එක්දහසක් (35,001,000.00) වන අගයේ සිට රුපියල් තිස්පන් මිලියන පන්සියයයි (35,000,500.00) වන අගයට අඩු කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය අනුව,

කෝපරේට් ඩී. සොලූටියෝ (පීවීටී) එල්ටීඩී,
ලේකම්වරු.

2026 ජනවාරි මස 19 වැනි දින.

02 - 220

ඩී. ටී. එස්. කන්සල්ටිං (පීවීටී) එල්ටීඩී
සමාගම් ලියාපදිංචි අංකය - පීවී 3498
ප්‍රකාශිත ප්‍රාග්ධනය අඩු කිරීමේ යෝජනාව

ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 59(2) වගන්තිය ප්‍රකාරව ඩී. ටී. එස්. කන්සල්ටිං (පීවීටී) එල්ටීඩී (ලියාපදිංචි අංකය - පීවී 3498) සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය අඩු කිරීමේ යෝජිතය පිළිබඳ කෙරෙන ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 59(2) වගන්තිය අනුව, ඩී. ටී. එස්. කන්සල්ටිං (පීවීටී) එල්ටීඩී (ලියාපදිංචි අංකය පීවී 3498) සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය, රු. 26,444,656.40 (රුපියල් විසි හය මිලියන හාරලක්ෂ හතළිස් හතරදහස් හයසිය පනස් හයයි සත

හතළිහ) සිට රු. 2,644,465.64 (රුපියල් දෙමිලියන හය ලක්ෂ හතළිස් හතර දහස් හාරසිය හැට පහයි ශත හැට හතර) දක්වා අඩු කරනු ලබන බව මෙයින් දැනුම් දෙයි. මෙම අඩු කිරීම, එක් කොටසකට රු. 10 බැගින් වටිනා සාමාන්‍ය ඡන්ද කොටස් 2,380,0019 ක් අවලංගු කිරීමෙන් සහ කොටස්හිමියාට රු. 23,800,190.76 (රුපියල් විසි තුන් මිලියන අට ලක්ෂ එකසිය අනූවයි ශත හැත්තෑ හය) මුදල ආපසු ගෙවීම මගින් සිදු කරනු ලබයි.

මණ්ඩලයේ අණ පරිදි,

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් - RCS2000015,
සමාගම් ලේකම්වරු.

වර්ෂ 2026 ක් වූ පෙබරවාරි මස 20 දින දී ය.

02 - 354

මහජනතාව වෙත දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත පුද්ගලික සමාගම සංස්ථාපනය කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම	:	ඩෙසිලියන්ට් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය	:	පී වී 00353061
ලියාපදිංචි දිනය	:	2026.01.20
ලියාපදිංචි කාර්යාලය	:	අංක 42/16, බාන්ස් රත්වත්ත මාවත, බලංගොඩ

සමාගම් අධ්‍යක්ෂ.

02 - 323

සීඩාර් කැපිටල් (පුද්ගලික) සමාගම
(සමාගම් ලියාපදිංචි අංකය පීවී 101589)

මහජනතාව වෙත කරනු ලබන දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 59 වගන්තියේ විධිවිධානවලට අනුකූලව, සාමාන්‍ය කොටස් 10,000,001 කින් නියෝජනය වන සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් මිලියන සියයයි දහයේ (රු. 100,000,010) සිට රුපියල් මිලියන පහළොවයි දහයක් (රු. 15,000,010) දක්වා අඩු කිරීම සඳහා වන යෝජනාව සීඩාර් කැපිටල් (පුද්ගලික) සමාගමේ (“සමාගම”) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි කොටස්හිමියන්ට නිර්දේශ කිරීමට තීරණය කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස, සාමාන්‍ය කොටස් සංඛ්‍යාව කොටස් පහළොස් ලක්ෂ එකක් (1,500,001) දක්වා අඩු කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පුද්ගලික) සමාගම,
සමාගම් ලේකම්වරු.

02 - 388

ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 242 (1) වගන්තිය ප්‍රකාරව සිදුකරනු ලබන ඒකාබද්ධ කිරීම

LOLC ඇඩ්වාන්ස්ඩ් ටෙක්නොලොජීස් (පුද්ගලික) සමාගම - PV 125403 (“LOAT”) සහ බෙස්ටී බෙවරේජස් (පුද්ගලික) සමාගම - PV00220041 (“BESTIE”) යන සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල විසින් 2007 අංක 7 දරන සමාගම් පනතේ 242 (1) වගන්තිය ප්‍රකාරව LOAT සමාගම සමග BESTIE සමාගම ඒකාබද්ධ කිරීමට තීරණය කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ. BESTIE යනු LOLC ඇඩ්වාන්ස්ඩ් ටෙක්නොලොජීස් (පුද්ගලික) සමාගමට පූර්ණ වශයෙන් අයිති අනුබද්ධ සමාගමකි. එකී ඒකාබද්ධ කිරීමේ කොන්දේසි ප්‍රකාරව, සියලුම BESTIE කොටස් කිසිදු ගෙවීමකින් හෝ වෙනත් ප්‍රතිලාභයකින් තොරව අවලංගු කරනු ලබන අතර, BESTIE සමාගමේ සියලුම වත්කම් සහ වගකීම් LOAT සමාගම විසින් පවරා ගනු ලබයි. ඒකාබද්ධ වීමෙන් පසු අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන සමාගම LOAT වනු ඇත. LOAT සමාගමේ වත්මන් අධ්‍යක්ෂවරුන් ඒකාබද්ධ කිරීමෙන් පසු නිර්මාණය වන සමාගමේ අධ්‍යක්ෂවරුන් ලෙස තවදුරටත් කටයුතු කරනු ඇත.

මෙම යෝජිත ඒකාබද්ධ කිරීම සමාගම් දෙකෙහිම උපරිම යහපත පිණිස වන බවත්, ඒකාබද්ධ කිරීම බලාත්මක වූ වහාම ඒකාබද්ධ වූ සමාගම (LOAT) ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණය සමත්වන බවටත් සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල විශ්වාසය පළ කරති.

මෙම ඒකාබද්ධ කිරීම 2026 පෙබරවාරි මස 27 දින හෝ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන වෙනත් දිනක සිට බලාත්මක වනු ඇත.

LOLC ඇඩ්වාන්ස්ඩ් ටෙක්නොලොජීස් (පුද්ගලික) සමාගම සහ බෙස්ටී බෙවරේජස් (පුද්ගලික) සමාගම යන සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලවල නියෝගය පරිදි,

LOLC කෝපරේට් සර්විසස් (පුද්ගලික) සමාගමේ ලේකම්වරු.

2026 ජනවාරි මස 29 දින.

02 - 291

ඒසීපී ඇඩ්වයිසර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

මහජනයා වෙත කරනු ලබන දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 242 වගන්තියේ (3) (ආ) උප වගන්තිය යටතේ ඒසීපී ඇඩ්වයිසර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් ලියාපදිංචි අංක 118296) සහ ට්‍රිනිටි ලෑන්ඩ් ඇන්ඩ් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් ලියාපදිංචි අංක පීවී 323929) යන සමාගම් ඒකාබද්ධ කිරීමේ යෝජනාව පිළිබඳව, පනතේ 242(1) වගන්තිය යටතේ මහජනයා වෙත කරනු ලබන දැනුම් දීමයි.

ට්‍රිනිටි ලෑන්ඩ් ඇන්ඩ් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් හි පූර්ණ හිමිකාරිත්වය සහිත අනුබද්ධිත සමාගමක් වන ඒසීපී ඇඩ්වයිසර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය සහ ට්‍රිනිටි ලෑන්ඩ් ඇන්ඩ් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒසීපී ඇඩ්වයිසර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ට්‍රිනිටි ලෑන්ඩ් ඇන්ඩ් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් සමග ඒකාබද්ධ කිරීමට 2026 ජනවාරි මස 19 දින තීරණය කර ඇත. පනතේ 242(1) වගන්තිය ප්‍රකාරව, ට්‍රිනිටි ලෑන්ඩ් ඇන්ඩ් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් තවදුරටත් පවතිනු ඇති අතර, ඒසීපී ඇඩ්වයිසර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නොපවතිනු ඇත.

මෙම නිවේදනය නිකුත් කළ දින සිට දින 20 කට නොඅඩු කාලයක් තුළ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් පනතේ 242(1) වගන්තිය ප්‍රකාරව ඒකාබද්ධ කිරීමේ සහතිකය නිකුත් කළ පසු ඒසීපී ඇඩ්වයිසර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ට්‍රිනිටි ලෑන්ඩ් ඇන්ඩ් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම් ලියාපදිංචි කිරීම සඳහා සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා සමග ඒකාබද්ධ කිරීමේ යෝජනාව එම පනතේ 243 වගන්තියේ දක්වා ඇති ලියකියවිලි පිරවීමෙන් පසුව ඒකාබද්ධ කිරීම බලාත්මක වනු ඇත.

පනතේ 242(4) වගන්තියට අනුව, ඒසීපී ඇඩ්වයිසර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ට්‍රිනිටි ලෑන්ඩ් ඇන්ඩ් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල විසින් ඒකාබද්ධ කිරීම අනුමත කරන යෝජනාවක් ලෙස සලකනු ලබන ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපත් සමාගමේ ඕනෑම කොටස්හිමියෙකුට හෝ ණයහිමියෙකුට හෝ සමාගම් බැඳීමක් ඇති ඕනෑම පුද්ගලයෙකුට සාමාන්‍ය ව්‍යාපාරික වේලාවන් තුළ කොළඹ 10, දේවානම්පියතිස්ස මාවතේ අංක 7 1/2 පිහිටි ඩිනිට්වේ කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ ලේකම්වරුන්ගේ කාර්යාලයේ දී පරීක්ෂා කිරීම සඳහා ලබා ගත හැක.

සමාගමේ කොටස්හිමියෙකු හෝ ණයහිමියෙකු හෝ සමාගම බැඳීමක් යටතේ සිටින ඕනෑම පුද්ගලයෙකුට ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපතක් සමාගමට කරන ලද ඉල්ලීමකට අනුව නොමිලේ ලබා ගැනීමට හිමිකම් ඇත.

ඒසීපී ඇඩ්වයිසර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අධ්‍යක්ෂවරුන් විසින්.

2026 ජනවාරි මස 19 දින.

02 - 326

වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින්, 1974 අංක 10 දරන පනතින් හා 2000 අංක 54 දරන පනතින් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය පහසුකම් යොමු අංකය : 78232713

කඩුවෙල, වැලිවිට, අවිස්සාවේල්ල පාර, අංක 65/Bහි පදිංචි,

1. ප්‍රගීත් රංගජීව අරන්දර මහතාගේ, සහ
2. ඉරංගා කේෂිණී පීරිස් මහත්මිය යන දෙදෙනාගේ උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2024.02.16 දින අංක 2372 දරන *ගැසට් පත්‍රයේ* හා 2024 පෙබරවාරි මස 15 බ්‍රහස්පතින්දා දින "ඩේලි නිව්ස්", "තිනකරන්" සහ "දිනමිණ" යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකුණනු ලබන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වගන්තිය යටතේ අයකරගත හැකි ගාස්තු හා මුදල්ද අයකරගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේදීම

2026.03.16 වන දින පෙ.ව 10.00ට,

කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි M/s ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස්හි වෙන්දේසිකාර මුදුගමුවේ හේවාවසම් තුසිත් කරුණාරත්න විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේපත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ කඩුවෙල මහනගර සභා සීමාවේ අංක 495/A ඇවරිහේන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ හෝකන්දර පිහිටි සුසාන භූමිය පාරේ වරිපනම් අංක 55/3 දරන "දවටගහවලගොඩැල්ල" නමැති ඉඩමට එහි ඇති පස, ගොඩනැගිලි, ගහකොළ, වැවිලි ඇතුළත්ව බලයලත් මිනින්දෝරු ටී. ඩී. කේ. ආර්. පී. පාතේගම විසින් සාදන ලද 2016 නොවැම්බර් මස 28 දිනැති අංක 6121 දරන පිඹුරෙහි ලොට් 16 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර දක්වා ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 16 උතුරට : මෙහි ලොට් D2 ද, නැගෙනහිරට : මෙහි ලොට් 17 ද, දකුණට : මෙහි ලොට් R1 ද, බස්නාහිරට : මෙහි ලොට් 14 හා 15 ද මායිම්ව එකී අංක 6121 දරන පිඹුරට අනුව පර්චස් එකොළහයි දශම හතරයි බිංදුවක (පර්. 11.40) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 1274/20 ලියාපදිංචි කර ඇත.

දෙවන උපලේඛනය

1. එකී හෝකන්දර පිහිටි "දවටගහවලගොඩැල්ල" නමැති ඉඩමේ අංක 6121 දරන පිඹුරෙහි ලොට් R1 (අඩි 20 පළල පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී R1 උතුරට : මෙහි ලොට් 14 හා 16 සිට 19 දක්වා ද, නැගෙනහිරට : සුසානභූමි පාර ද, දකුණට : පොදු සුසානභූමිය ද, බස්නාහිරට : මෙහි ලොට් R3, R2 හා 12 ද මායිම්ව එකී අංක 6121 දරන පිඹුරට අනුව පර්චස් දහසයයි දශම දෙකයි බිංදුවක (පර්.16.20) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 1426/05 හි ලියාපදිංචි කර ඇත.

2. එකී හෝකන්දර පිහිටි "දවටගහවලගොඩැල්ල" නමැති ඉඩමේ අංක 6121 දරන පිඹුරෙහි ලොට් R2 (අඩි 15 පළල පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් R2 උතුරට : මෙහි ලොට් 15 ද, නැගෙනහිරට : මෙහි ලොට් 14 ද, දකුණට : මෙහි ලොට් R1 හා R3 ද, බස්නාහිරට : මෙහි ලොට් 12 හා 5 ද මායිම්ව එකී අංක 6121 දරන පිඹුරට අනුව පර්චස් තුනයි දශම හයයි බිංදුවක (පර්.3.60) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 1426/03 හි ලියාපදිංචි කර ඇත.

3. එකී හෝකන්දර පිහිටි "දවටගහවලගොඩැල්ල" නමැති ඉඩමේ අංක 6121 දරන පිඹුරෙහි ලොට් R3 (අඩි 16 පළල පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් R3 උතුරට : මෙහි ලොට් 11 හා 12 ද, නැගෙනහිරට : මෙහි ලොට් R1 හා R2 ද, දකුණට : පොදු සුසානභූමිය ද බස්නාහිරට : මෙහි ලොට් R 4 ද මායිම්ව එකී අංක 6121 දරන පිඹුරට අනුව පර්චස් පහක (පර්.5) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 1426/07 හි ලියාපදිංචි කර ඇත.

4. එකී හෝකන්දර පිහිටි "දවටගහවලගොඩැල්ල" නමැති ඉඩමේ අංක 6121 දරන පිඹුරෙහි ලොට් R4 (අඩි 15 පළල පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් R4 උතුරට : මෙහි ලොට් 7 හා D1 ද, නැගෙනහිරට : මෙහි ලොට් 11 ,6 හා R3 ද, දකුණට : පොදු සුසානභූමිය ද, බස්නාහිරට : මෙහි ලොට් 9 ,10 හා 8 ද මායිම්ව එකී අංක 6121 දරන පිඹුරට අනුව පර්චස්

පහයි දශම හයයි බිංදුවක (පර්.5.60) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 1274/24 හි ලියාපදිංචි කර ඇත.

5. එකී හෝකන්දර පිහිටි ''දවටගහවලගොඩැල්ල'' නමැති ඉඩමේ අංක 6121 දරන පිඹුරෙහි ලොට් D1 (අඩි 1 පළල කාණුවට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් D1 උතුරට : මෙහි ලොට් 1 සිට 3 දක්වා ද, නැගෙනහිරට : මෙහි ලොට් 6 ද, දකුණට : මෙහි ලොට් R4 හා 7 ද, බස්නාහිරට : මෙහි ලොට් 7 හා 1 ද මායිම්ව එකී අංක 6121 දරන පිඹුරට අනුව පර්චස් බිංදුවයි දශම තුනයි බිංදුවක (පර්. 0.30) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 1426/08 හි ලියාපදිංචි කර ඇත.

6. එකී හෝකන්දර පිහිටි ''දවටගහවලගොඩැල්ල'' නමැති ඉඩමේ අංක 6121 දරන පිඹුරෙහි ලොට් D2 (අඩි 1 පළල කාණුවට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් D2 උතුරට : අංක 2114 දරන පිඹුරෙහි ලොට් R2 සිට R4 දක්වා ද, නැගෙනහිරට : සුසානභූමිය පාර ද, දකුණට : මෙහි ලොට් 19, 18, 17, 16 හා 15 ද, බස්නාහිරට : මෙහි ලොට් 4 හා 5 ද මායිම්ව එකී අංක 6121 දරන පිඹුරට අනුව පර්චස් බිංදුවයි දශම අටයි බිංදුවක (පර්. 0.80) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 1426/09 හි ලියාපදිංචි කර ඇත.

7. එකී හෝකන්දර පිහිටි ''දවටගහවලගොඩැල්ල'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වී. එෆ්. ජේ.පෙරේරා විසින් සාදන ලද 1982 ඔක්තෝබර් 08 දිනැති අංක 8261 දරන පිඹුරෙහි ලොට් S (අඩි 15 පළල පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් S උතුරට : ලොට් P සහ T ද, නැගෙනහිරට : පාර හා ලොට් T ද, දකුණට : ලොට් Q හා R ද, බස්නාහිරට : ලොට් Q ද මායිම්ව එකී අංක 8261 දරන පිඹුරට අනුව පර්චස් තිස් තුනක (පර්. 33) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 1111/55 හි ලියාපදිංචි කර ඇත.

8. එකී හෝකන්දර පිහිටි ''දවටගහවලගොඩැල්ල'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ.ඊ.විජේසූරිය විසින් සාදන ලද 1983 දෙසැම්බර් 28 දිනැති අංක 2077 දරන පිඹුරෙහි ලොට් R1 (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් R1 උතුරට : අංක 8261 දරන පිඹුරෙහි ලොට් S (අඩි 15 පළල පාරට වෙන් කළ කොටස) ද, නැගෙනහිරට : පාර ද, දකුණට : අංක 8261 දරන පිඹුරෙහි ලොට් Rහි කොටසක් ද, බස්නාහිරට : ලොට් K (අඩි 5 පළල පාරට වෙන් කළ කොටස) ද මායිම්ව එකී අංක 2077 දරන පිඹුරට අනුව පර්චස් තුනයි දශම දෙකයි බිංදුවක (පර්. 3.20) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 1111/53 හි ලියාපදිංචි කර ඇත.

9. එකී හෝකන්දර පිහිටි ''දවටගහවලගොඩැල්ල'' නමැති ඉඩමේ අංක 2077 දරන පිඹුරෙහි ලොට් T1 (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් T1 උතුරට : අංක 8261 දරන පිඹුරෙහි ලොට් T හි කොටසක් ද, නැගෙනහිරට : පාර ද, දකුණට : අංක 8261 දරන පිඹුරෙහි ලොට් S (අඩි 15 පළල පාරට වෙන් කළ කොටස) ද, බස්නාහිරට : ලොට් S (අඩි 15 පළල පාරට වෙන් කළ කොටස) ද මායිම්ව එකී අංක 2077 දරන පිඹුරට අනුව පර්චස් තුනයි දශම හයයි බිංදුවක (පර්. 3.60) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 1111/24 හි ලියාපදිංචි කර ඇත.

1. ගෙවීම් කරන ආකාරය : වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් සිදු කළ යුතුය :

1.1 ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්) ද,

1.2 වැට් (VAT) බදු අයකරගැනීම් (අදාළ වේ නම්) ද,

1.3 විකුණුම් බද්ද ලෙස පළාත් පාලන අධිකාරියට 1% (සියයට එකක්) ද,

1.4 වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස 2.5% (සියයට දෙකයි දශම පහක්) ද,

1.5 විකුණුම් පිරිවැය සහ වෙනත් අයකරගැනීම් වෙතොත් ඒ සැම,

1.6 වෙනත් ගාස්තු/අයකරගැනීම් ද,

වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ගැනුම් මිලෙන් තවත් 10% (සියයට දහයක්) ද ගැනුම් මිලේ ඉතිරි 80% විකුණනු ලබන දිනයේ සිට මාස තුනක් ඇතුළත ද පියවිය යුතුය. ඊට අමතරව විකිණීමේ කොන්දේසි ගිවිසුම සහ විකුණුම් සහතික සඳහා මුද්දර බදු සහ නොතාරිස් ගාස්තු ද ගැනුම්කරු විසින් ගෙවිය යුතුය.

ඉහත දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීමට ගැනුම්කරු අපොහොසත් වන්නේ නම් වෙන්දේසි දිනයේදී ගෙවන ලද සියලු මුදල් බැංකුව සන්තකකිරීමේ සහ දේපළ නැවත වෙන්දේසිකිරීමේ අයිතිය බැංකුව සතුය.

1. දේපළට ප්‍රවේශ වන ආකාරය:

බොරැල්ලේ සිට කොට්ටාව පාරේ ගමන් කර තලවතුගොඩ හන්දියට පැමිණ හෝකන්දර පාරට වමට හැරෙන්න. එහි කිලෝමීටර 2.1ක් පමණ ඉදිරියට ගොස් කනත්ත පාරට වමට හැරෙන්න. එහි මීටර් 600ක් පමණ යන විට "AVRA" නමින් සම්පූර්ණ විකුණන ඉඩමක් වම් පසින් දැකිය හැකිය (කනත්තට යාබදව). ඇතුල් පාරට හැරී මීටර් 50ක් පමණ ගමන් කළ පසු මෙම පාරට මුහුණලා දකුණු පස අදාළ දේපළ පිහිටා ඇත.

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

"ලංසුකරුවන්ට ඉහත සඳහන් දේපලට අදාළ හිමිකම් ඔප්පු හා වෙනත් සම්බන්ධිත ලේඛන 0112859112/ 0113175401 දුරකථන අංක ඔස්සේ ලංකා බැංකුවේ පාදුක්ක ශාඛාවේ කළමනාකාරිණී හා සම්බන්ධ වී පරීක්ෂා කිරීමට නිදහස ඇත."

කේ පී සී ජී පතිරගේ,
කළමනාකාරිණී.

ලංකා බැංකුව
පාදුක්ක ශාඛාව.

02 - 363

ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින්, 1974 අංක 10 දරන නීතියෙන් සහ 2000 අංක 54 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංක : 74169557
77891277

මහරගම, පමුණුව, අංක 92ඊ හි පිහිටි සීමාසහිත ස්කයි සෙරමික්ස් (පුද්ගලික) සමාගමට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

අධ්‍යක්ෂවරු :
මාලඹේ තලාහේන, බෝගහවත්ත පාර අංක 765/E හි
1. විතින්ව සම්පත් ගජදීර
2. හිමාලි ජයවර්ධන

ලංකා බැංකු ආඥා පනතේ 19 වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2024 ජනවාරි 12 දින අංක 2367 දරන *ගැසට්* පත්‍රයේ හා 2024 ජනවාරි 12 සිකුරාදා දින දිනමිණ, තිනකරන් හා ඩේලිනිව්ස් යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥා පනතේ අංක 26 වගන්තිය යටතේ අයකරගත හැකි ගාස්තු හා මුදල්ද අයකරගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේදීම

2026.03.16 වන දින ප.ව. 1.00ට,

ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස්හි බලයලත් වෙන්දේසිකාර මුදුගම්වේ හේවාවසම් තුසිත් කරුණාරත්න විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලයේ, පල්ලේපත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තලංගම උතුර ඊ ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාස අංක 477 හි කඩුවෙල මහ නගර සභා සීමාවේ තලංගම උතුරේ පිහිටි තලාහේන පාර වරිපනම් අංක 14/43 දරන බෝගහවත්ත සහ බෝගහලන්ද නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. එම්. එස්. අත්තනායක විසින් සාදන ලද 2014 මැයි 27 දිනැති අංක 4549 දරන පිඹුරේ මායිම් නිරූපනය කර ලොට් 1 ලෙස ලකුණු කළ බෙදන ලද්දා වූ විස්තර කළ එකී ලොට් 1, උතුරට : බෝගහවත්ත පාර ද, නැගෙනහිරට : අංක 8346 ඊ දරන පිඹුරේ ලොට් ඊ ද, දකුණට : අංක 7/33 දරන පිඹුරේ ලොට් 1 ද, බස්නාහිරට : ජී. පී. ඉන්ද්‍රාණි පෙරේරා හිමිකම් කියන ඉඩම ද මායිම්ව එකී අංක 4549 දරන පිඹුර අනුව පර්චස් විස්සක් (පර්. 20) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම සමග එහි පිහිටි ගහ කොළ වැවිලි ගොඩනැගිලි සහ වැවෙන සියලු දේ සමග වේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 746/40 හි ලියාපදිංචි කර ඇත.

1. ගෙවීම් කරන ආකාරය : වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් සිදු කළ යුතුය.

1.1 ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්) ද,
1.2 වැට් (VAT) බදු අයකරගැනීම් (අදාළ වේ නම්) ද,
1.3 විකුණුම් බද්ද ලෙස පළාත් පාලන අධිකාරියට 1% (සියයට එකක්) ද,
1.4 වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස 2.5% (සියයට දෙකයි දශම පහක්) ද,
1.5 විකුණුම් පිරිවැය සහ වෙනත් අයකරගැනීම් වෙතොත් ඒ සැම,
1.6 වෙනත් ගාස්තු/අයකරගැනීම් ද.

වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ගැනුම් මිලෙන් තවත් 10% (සියයට දහයක්) ද ගැනුම් මිලෙහි ඉතිරි 80% විකුණනු ලබන දිනයේ සිට මාස තුනක් ඇතුළත ද පියවිය යුතුය. ඊට අමතරව විකිණීමේ කොන්දේසි ගිවිසුම සහ විකුණුම් සහතික සඳහා මුද්දර බදු සහ නොතාරිස් ගාස්තු ද ගැනුම්කරු විසින් ගෙවිය යුතුය.
ඉහත දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීමට

ගැනුම්කරු අපොහොසත් වන්නේ නම් වෙන්දේසි දිනයේදී ගෙවන ලද සියලු මුදල් බැංකුව සන්තකකිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ අයිතිය බැංකුව සතුය.

2. දේපළට ප්‍රවේශ වන ආකාරය: බත්තරමුල්ල හන්දියේ සිට කඩුවෙල පාර ඔස්සේ කිලෝමීටර් 3.5 ක් පමණ ඉදිරියට ගොස් තලාහේන හන්දිය දක්වා ගමන් කරන්න. ඉන්පසු වමට හැරී තලාහේන පාර දිගේ මීටර් 150ක් පමණ දකුණු පැත්තෙහි දඹුගහවත්ත පාර දක්වා ගමන් කර, දඹුගහවත්ත පාර දිගේ මීටර් 50ක් පමණ බෝගහවත්ත පාර දක්වා ගමන් කරන්න. නැවතත් වමට හැරී බෝගහවත්ත පාර දිගේ මීටර් 400ක් පමණ ඉදිරියට ගිය පසු, දේපළ දකුණු පැත්තෙහි පිහිටා ඇත.

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ලංසුකරුවන්ට ඉහත සඳහන් දේපළට අදාළ හිමිකම් ඔප්පු හා වෙනත් සම්බන්ධිත ලේඛන 0113082126/ 0112852915/ 0112821287 දුරකථන අංක ඔස්සේ ලංකා බැංකුවේ නුගේගොඩ ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු හා සම්බන්ධ වී පරීක්ෂා කිරීමට නිදහස ඇත.

කේ. එම්. දිල්හානි,
ප්‍රධාන කළමනාකාරිනී.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව - නුගේගොඩ.

02 - 364

ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සහ 2000 අංක 54 දරන පනතින් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැනුම්දීම.

කොළඹ 10, ශ්‍රී සංඝරාජ මාවත, අංක 310 හි හම්සා ට්‍රේඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි ණය වගකීම වෙනුවෙන් මහනුවර, මහයියාව, පිටකන්ද පාර, වරිපනම් අංක 15/2, 15/4 හි පිහිටි උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2023 දෙසැම්බර් 15 දිනැති අංක 2363 දරන ගැසට්පත්‍රයේ හා 2023 දෙසැම්බර් 15 දින ''ඩේලිනිවුස්'', ''තිනකරන්'' හා ''දිනමිණ'' යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥා පනතේ 26 වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍ර එකී ස්ථානයේදීම

2026 මාර්තු 17 වන දින ප.ව 1.00 ට,

කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි පිහිටි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් වෙන්දේසිකාර සමාගමේ එම්. එච්.ටී කරුණාරත්න විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

උපලේඛනය

01. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහනගර සභා සීමාවේ, ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාපානවතුර ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ, මහයියාවෙහි පිහිටි 'ටැපින්ටන් එස්ටේට්' නැමැති ඉඩම හා පරිශ්‍රය බලයලත් මිනින්දෝරු සී.ඩී ආදිහෙට්ටි විසින් සාදන ලද 2007 මැයි 18 දිනැති අංක 4441B දරන පිඹුරෙහි ලොට් 3 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල පර්චස් දහයයි දශම තුනයි බිංදුවක (පර්.10.30) හෙවත් හෙක්ටයාර් 0.02605 ක බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර උතුරට: පිටකන්ද පාරේ වරිපනම් අංක 19/1 දරන පරිශ්‍රය වෙන් කරන දැනට පවත්නා තාප්පයද; නැගෙනහිරට: එකී පිඹුරෙහි ලොට් 2 හා 5 ද; දකුණට: පිටකන්ද පාරේ, වරිපනම් අංක 15/5 දරන පරිශ්‍රය හා එකී පිඹුරෙහි ලොට් 6 ලෙස දක්වා ඇති පාරද; බස්නාහිරට: එකී පිඹුරෙහි ලොට් 4 ද මායිම් වූ භූමිය සහ ඒ තුළ ඇති වෙනත් සියලු දේ ඇතුළත් වේ. ඒ සමඟ මෙයට එකී පිඹුරෙහි ලොට් 5 ලෙස දක්වා ඇති මාර්ගය භාවිතයට ද අයිතිය ඇති අතර මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 360/255 හි ලියාපදිංචි කර ඇත.

02. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහනගර සභා සීමාවේ, මහයියාවෙහි පිහිටි 'ටැපින්ටන් එස්ටේට්' නැමැති ඉඩමට හා පරිශ්‍රයට බලයලත් මිනින්දෝරු සී.ඩී ආදිහෙට්ටි විසින් සාදන ලද 2007 මැයි 18 දිනැති අංක 4441B දරන පිඹුරෙහි ලොට් 4 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල පර්චස් එකොළහක (අ.0 රූ.0 පර්.11) හෙවත් හෙක්ටයාර් 0.02782 ක බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර උතුරට: පිටකන්ද පාරේ, වරිපනම් අංක 19/1 දරන පරිශ්‍රය වෙන් කරන දැනට පවත්නා තාප්පයද; නැගෙනහිරට: එකී පිඹුරෙහි ලොට් 3 ද; දකුණට: එකී පිඹුරෙහි ලොට් 6 හා 7 ද; බස්නාහිරට: දුම්රිය පාරට වෙන් කළ රජයට අයිති කොටසද සමඟ එහි ඇති වෙනත් සියලු දේ අයත් වන අතර එකී පිඹුරෙහි ලොට් 5 ලෙස දක්වා ඇති පාර භාවිතයට අයිතිය ද ඇත. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A360/256 හි ලියාපදිංචි කර ඇත.

03. එකී ලොට් 3 හා 4 බලයලත් මිනින්දෝරු එන්.එස්. එල්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1970 ඔක්තෝබර් 24 දිනැති අංක 967 දරන පිඹුරෙහි ලොට් 10 සහ බලයලත් මිනින්දෝරු එන්.එස්.එල්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1970 මාර්තු 28 දිනැති අංක 969 දරන පිඹුරෙහි නිරූපිත ඉඩමෙහි කොටසක් වේ.

ගෙවීම් කරන ආකාරය: වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැනුම් කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් සිදුකළ යුතුය :

1.1 ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්)ද,
1.2 වැට් (VAT) අයකර ගැනීම් (අදාළ වේ නම්)ද,
1.3 දේශීය විකුණුම් බද්ද ලෙස පළාත් අධිකාරියට 1% (සියයට එකක්) ද,
1.4 වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස 2.5% (සියයට දෙකයි දශම පහක්) ද,
1.5 විකුණුම් පිරිවැය සහ වෙනත් ගෙවීම් වෙතොත් ඒ සැම,
1.6 ගාස්තු හා වෙනත් අයකර ගැනීම්.

වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ගැනුම් මිලෙන් තවත් 10% (සියයට දහයක්) ද ගැනුම් මිලේ ඉතිරි 80% (සියයට අසූව) වෙන්දේසි දිනයේ සිට මාස තුනක් ඇතුළත ද පියවිය යුතුය. එයට අමතරව විකිණීමේ කොන්දේසි ගිවිසුම සහ විකුණුම් සහතික සඳහා මුද්දර බදු සහ නොතාරිස් ගාස්තුද ගැනුම් කරු විසින් ගෙවිය යුතුය.

ඉහත දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීමට ගැනුම් කරු අපොහොසත් වන්නේ නම් වෙන්දේසි දිනයේ දී ගෙවන ලද සියලු මුදල් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත විකිණීමේ අයිතිය බැංකුව සතුය.

දේපළ වෙත ප්‍රවේශ වන මාර්ගය: මහනුවර පිටකන්ද පාර දිගේ වරිපනම් අංක 15A දරන පරිශ්‍රය තෙක් මීටර් 150 ක පමණ දුරක් ඉදිරියට ගොස් වමට හැරී එකී පරිශ්‍රයේ උතුර මායිම දිගට දිවෙන පාර දිගේ මීටර් 30 ක් පමණ ගමන් කර ලොට් 3 වෙත ප්‍රවේශ විය හැක. අංක 15/A දරන පරිශ්‍රයේ දකුණු මායිම දිගට දිවෙන පොදු මාර්ගය දිගේ ඉදිරියට ගමන් කිරීමෙන් ලොට් 4 වෙත ප්‍රවේශ විය හැක.

ඉහත සඳහන් දේපළවලට අදාළ හිමිකම් ඔප්පු හා වෙනත් සම්බන්ධිත ලේඛන ආයතනික අයකර ගැනීම් අංශයේ දී පරීක්ෂා කිරීමට ලංසුකරුවන්ට අවසර ඇත. දුරකථන අංකය 011-2386079

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ.සී.එච්.අතුකෝරළ,
ජ්‍යෙෂ්ඨ කළමණාකාරිණී,
ආයතනික අයකර ගැනීම්.

ලංකා බැංකුව,
ආයතනික අයකර ගැනීම් අංශය,
03 වන මහල,
අංක 01, ලංකා බැංකු මාවත,
කොළඹ 01.

02 - 360

සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එල්. ජී. එච්. සමරතුංග සහ ජී. ඩී. එම්. තිලකරත්න
ගිණුම් අංකය : 1205 5243 9288

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2025.07.30 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හැත්තෑ හය ලක්ෂ හැත්තෑ එක් දහස් හතයි ශත අනූ දෙකක (රු. 7,671,007.92) මුදල ද, 2025 අප්‍රේල් මස 09 වැනි දින සිට එකී අංක 8258 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හැට නව ලක්ෂ අසූ හතර දහස් දහ හතරයි ශත දහ හතරක (රු. 6,984,014.14) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ අටයි දශම බිංදුවක් (18.0%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2025.10.17 දින රජයේ *ගැසට් පත්‍රයේ*හා 2025.10.17 දින "දිවයින", "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි,

2026.04.07 දින, පෙ.ව. 11.00,

පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ සහ හාපිටිගම් කෝරළේ, යටිගහ පත්තුවේ සහ උඩුගහ පත්තුවේ, මීරිගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, බටලීය 25A ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ රදාවඩුන්න සහ බටලීය ග්‍රාමවල පිහිටි මහනුවර පාර, දකුණ පස්යාල, වරිපනම් අංක 374/03 දරන "කළුවක්මුල්ලේ වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. ඒ. එම්. පී. වෙත්තසිංහ විසින් සාදන ලද 2021 පෙබරවාරි මස 20 දාතම හා අංක 93 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 15 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : මෙහි ලොට් 3; නැගෙනහිරට : මෙහි ලොට් 14 නමුත් වඩා නිවැරදිව ලොට් 14 සහ මෙහි ලොට් 4 (අඩි 20 පළල පාර); දකුණට : මෙහි ලොට් 16 සහ බස්නාහිරට : මෙත්සිරිගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් අටයි දශම තුනයි හතක් (පර්. 38.37) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 93 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව H 348/147 යටතේ අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 93 දරන පිඹුරේ එකී ලොට් 15 බලයලත් මානක තැන වී. ගාමිණි විතාන විසින් සාදන ලද 2020 පෙබරවාරි මස 25 දාතම හා අංක 1568 හි නිරූපිත ලොට් 3 හි උපබෙදුමක් වන අතර තවත් අයුරකින් බලයලත් මානක තැන කේ. එස්. දිසානායක විසින් සාදන ලද 2018 ජුනි මස 08 දාතම හා අංක 4408 දරන පිඹුරේ නිරූපිත ලොට් A හි උප බෙදුමක් ද වන අතර එය පහතින් මැනවින් විස්තර කොට ඇත.

එකී රදාවඩුන්න සහ බටලීය ග්‍රාමවල පිහිටි "කළුවක්මුල්ලේ වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. එස්. දිසානායක විසින් සාදන ලද 2018 ජුනි මස 08 දාතම හා අංක 4408 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : පාර (මාර්ග සංවර්ධන අධිකාරිය); නැගෙනහිරට: මෙහි ලොට් B, G සහ F; දකුණට : කස්තුරිආරච්චිගේ ඉඩම සහ බස්නාහිරට: කස්තුරිආරච්චිගේ ඉඩම චන්ද්‍රපාල සහ වෙනත් අයගේ ඉඩම ඇළ මෙත්සිරිගේ ඉඩම පාර සහ රාජසිංහගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දහ තුනයි රූඩ් එකයි පර්චස් නවයක් (අ. 13, රූ.1, පර්. 9) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 4408 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව H 348/147 යටතේ අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ දිගේ ඒ මතින් ඒ යටින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද ඒ හා බැඳුනු වෙනත් අයිතීන් ද හා සමග ය.

1. බලයලත් මානක තැන ඩබ්ලිව්. ඒ. එම්. පී. වෙත්තසිංහ විසින් සාදන ලද 2021 පෙබරවාරි මස 20 දාතම හා අංක 93 දරන පිඹුරේ නිරූපිත ලොට් 4 (අඩි 20 පළල පාර);

2. බලයලත් මානක තැන වී. ජී. විතාන විසින් සාදන ලද 2020 මැයි මස 26 දාතම හා අංක 1607 දරන පිඹුරේ නිරූපිත ලොට් 82 (අඩි 30 පළල පාර) සහ ලොට් 26 (අඩි 20 පළල පාර);

3. බලයලත් මානක තැන වී. ජී. විතාන විසින් සාදන ලද 2020 පෙබරවාරි මස 25 දාතම හා අංක 1568 දරන පිඹුරේ නිරූපිත කොළඹ සිට මහනුවර දක්වා පාර සහ වෙනත් පොදු මාර්ග අයිතීන්.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

